
# තේලපත්ත ජාතකය



සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

<u>මෙතෙක් ප්‍රසිද්ධවූ දහම් ග්‍රන්ථ</u>

1. මහා මංගල සූත්‍රය - 29.07.2007 ගල්දූව
2. යශෝධරා කථා වස්තුව - 2007 අවුරුද්දේම ගල්දූව
3. චන්ද්‍රලෝකය - 18.12.2008 ගල්දූව
4. තෘෂ්ණාව - 14.12.2011 තිස්සමහාරාමය, කිරින්ද
5. හෘථිපාල ජාතකය - 18.12.2012කාවන්තිස්සගම, තිස්සමහාරාමය
6. සොෂක සිටානෝ - 18.12.2012 කාවන්තිස්සගම, තිස්සමහාරාමය
7. මෙණ්ඩක ප්‍රශ්නය - 04.02.2013 කාවන්තිස්සගම, තිස්සමහාරාමය
8. කර්ම දායාද - 15.04.2013 ශ්‍රී විසුද්ධාරාමය, බුන්දල, හම්බන්තොට
9. දහම්සරණ - 19.09.2013 ධර්මාරාම යෝගාශ්‍රමය උග්ගල්බොඩ, ගම්පහ
10. සුතසෝම ජාතකය - 13.05.2014 අළුලෙන ආරණ්‍ය දඹේගොඩ, මාළිගාවිල
11. ප්‍රශ්න 3 අංක I - 13.11.2014 ගල්දූව, අම්බලන්ගොඩ
12. කොසොල් රජතුමා දුටු සිහින 16 - 15.03.2015 තලංගම, බත්තරමුල්ල
13. යශෝධරා කථා වස්තුව හයවන මුද්‍රණය 2015 මාර්තු බත්තරමුල්ල ලුම්බිණි සේනාසනය, උතුරු තලංගම බත්තරමුල්ල.
14. සත්බුදුරජාණන් වහන්සේලා

මෙම ග්‍රන්ථවල වැඩි විස්තර අවසානයට සඳහන්ව ඇත.

# තේලපත්ත ජාතකය

## අංක : 17

*සංස්කරණය*
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

# අනුග්‍රහය

''සියළුම දානයන් අභිබවා ධර්ම දානයම උතුම් වන්නේය'' යි, අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ සේක.

එය අවබෝධ කරගත් රක්වානේ සමගිපුර පදිංචිව සිට මෙයට වර්ෂයකට පෙර එනම් ක්‍රි.වර්ෂ 2014 අගෝස්තු මස 14 වන දින මිය පරලොව ගිය ඩබ්.ජී. විජේදාස මහතාට (74) භව ගමන ඉක්මන් භවයකින්ම නිමාකර සසර දුකින් මිදීම පිණිස මෙකුසල් බලය හේතු වේවා !!! යි' පතන්නේ

| | |
|---|---|
| යූ.එච්. සෝමලතා | ආදරණීය බිරිඳ |
| කුමාරි මල්ලිකා | ආදරණීය දියණිය |
| සුගත් චමින්ද | ආදරණීය පුතා |
| වසන්ත කුමාර | ආදරණීය පුතා |
| සවිඳු පහන් | ආදරණීය මුණුපුරා |
| සචිණි හිරණ්‍යා | ආදරණීය මිණිපිරී |

මෙම කුසල් බලයෙන් අප සැම දෙනාගේම නමින් මිය පරලොව ගියාවූ දෙමාපිය, ගුරුවර, අනෙකුත් හිතමිත්‍රාදීන්ටත් නිවන් සුව පිණිසම හේතු වේවා !!!

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

මෙම දහම් ග්‍රන්තය පළමුවෙන්ම සංස්කරණය කරනු ලැබුවේ ක්‍රි.වර්ෂ 2008 අගෝස්තු මස 22 වන දිනදීය. දෙවනුව නැවත පිටපත් කර සංශෝධනය කරන ලද්දේ ක්‍රි.වර්ෂ 2014 සැප්තැම්බර් මස 13 වන සෙනසුරාදා ගල්දූව ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමයේදීය.

# තේලපත්ත ජාතකය

## ශ්‍රී බුද්ධ වර්ෂ 2557 වප් අව පස්වන ශනිදින

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

එක්තරා ජනපදයක වසන සියළුම පුරුෂයන්ගේ සිත් වශීකරණ ඇස, කණ, නාසය, කය මත්කරවන සෑම ස්ත්‍රී ලාවන්‍යයෙන් සම්පූර්ණ ජනපද කල්‍යාණියක් එක්තරා රඟ මඩලක ඇගේ අඟ පසඟ ප්‍රදර්ශණය කරමින් සිංදු කියමින් රඟන රැඟුමක් බැලීමට නොයෙක් දෙසින් මනුෂ්‍යයෝ ඇගේ රූපලාවන්‍යය සහ රඟන රැඟුමක් බැලීමට නොයෙක් දෙසින් පිරිමින් ආශාවෙන් එහි පැමිණෙත්ද, රැස්ව සිටිත්ද, එම රූපයට,

ශබ්දයට මත්ව බලා සිටින අවස්ථාවක එම ජනපදයෙහි රජතුමා සිරගතව සිටින සිරකරුවෙකු ගෙන්වා මුට්ටියකට තෙල් පුරවා තොප මෙම තෙල් මුට්ටිය බිම නොතබා එක බිඳුවකුඳු බිමට නොසලා පෙරකී රූප සුන්දරිය රඟන රඟ මඩල ඉදිරියෙන් කිසිවෙකුගේ ඇගේ නොගෑවී තෙල් භාජනය ආරක්ෂා සහිතව ඇයගේ රූපය දෙස නොබලා සංගීතයට සවන් නොදී එහි

මදකුත් නතර නොවී එම ස්ථානය පසුකර ගියොත් තා විඳින දඩුවමින් නිදහස් කරමි. එසේ නොකලොත්, තෙල් බිඳකුදු බිම හැළුවොත් එතනදීම තාගේ හිස ගසා දමවයි කියා තා පිටුපස මෙම වධකයා එවමි. තාගේ ජීවිතයට ආසාව ඇත්නම් එසේ කරවයි කියා වදකයාද ඔහු පසුපස පරීක්ෂාකාරීව යන්නේය. මෙම හොරාද ජීවිතයට තිබෙන ආශාවත්, මරණ බියත් නිසා රජ අණ අනුව එම රඟමඬල පසුකර එයට ඇළුම් නොකර එම ස්ථානය පසුකර පලා ගියේය. එසේ පලාගියේ මරණ භිය නිසයි. එය පුදුමයක් නොවෙයි.

''එම්බා මහණෙනි, මාගේ ශාසනයෙහි කමටහන් ගෙන මහණ දම් පුරන්නාවූ යොගාවචරයා විසින්ද ජීවිත ආශාවෙන් පුරවන ලද තෙල් පාත්‍රයෙන් බිඳකුඳු නොසලා පඤ්ච ඉන්ද්‍රිය පිණවන ධේනුව දෙස නොබලා පිටුපසින් එන වධකයාගෙන් බේරීමට ගියාසේ තොපත් මහණදම් පිරිය යුතුය, යි වදාළ සේක.

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙසේ එම කාමධේනුව දෙස නොබලා නොඇලී තෙල් බඳුන ගෙනයාම ආශ්චයර්යක් වන්නේයයි'' භික්ෂූන් වහන්සේ සැළකර සිටි සේක. එසේ වදාළ භික්ෂූන් වහන්සේට බුදුරජාණන් වහන්සේ වදාරණ සේක්. ''එම්බල මහණෙනි, ඒ ආශ්චර්යය නොවෙයි. පුරාණයෙහි නුවණැත්තෝ තමන්ගේ දුරදක්නා නුවණ හේතුකොට ගෙන අමනුෂ්‍යයන් විසින් නිර්මිත කරන ලද දිව්‍ය රූපයෙහිද, දෑස් ඇරබැලීම් මාත්‍රයකුදු නොකොට අමනුෂ්‍ය අධිගෘහිත

පෙදෙසකින් ගැලවී ගොස් බරණැස් රාජ්‍ය ශ්‍රී සම්පත් ලබා ගත්තෙමි. එම භවයෙන් වැසුන පුවත වදාරණ සේක්වායි ආරාධනා කළසේක. එම ආරාධනාව ඉවසූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු රාජ්‍යය කරන කාලයක පුරන ලද පාරමිතා ඇති අප මහ බෝසතාණන් වහන්සේ එම රජතුමාට සිටි පුතුන් සියයගෙන් බාලම පුතා වී ඉපදුනි. මෙම කුමාරයා නුවණින් වර්ධනය වෙමින් වැඩුනේය. එම රාජ මාළිගයේ දිනපතා පසේබුදු රජාණන් වහන්සේ නමක් දන් වළඳති. මෙම කුමාරයා එම බුදුරජාණන් වහන්සේට නිසි උපස්ථාන කටයුතු කරයි. දිනක් කුමරු මෙසේ සිතීය. මාගේ වැඩිමහල් සහෝදර පිරිස බොහෝය. ඒ අනුව මට මෙහි රාජ්‍ය කිරීම ලැබේදෝයි, නොලැබේදෝයි සිතීය. මම මේ බැව් පසේ බුදුන් වහන්සේගෙන් දැනගනිම් යි සිතා පසු දින දානය සඳහා වැඩිය කල්හි දෙපා සෝදවා පිළිගෙන දානය වළඳා අවසානයේ එකත් පස්ව වැඳ මෙසේ විමසීය.

''ස්වාමීනි, මාගේ වැඩිමහල් සහෝදරයෝ බොහෝ වෙත්, එම නිසා මෙහි රාජ්‍ය මට ලැබෙයිද, නොලැබෙයිද යි, විමසීය. එමවිට පසේ බුදුන් වහන්සේ වදාරණසේක්, කුමාරයාණෙනි, තොපට මෙම රාජ්‍යයේ රජකම් කරන්න ලැබෙන්නේ නැත. එම නිසා මෙහි සිට යොදුන් එකසිය විස්සක් ගිය කල ගන්ධාර තක්ෂලා නමින් නුවරක් ඇත. එනුවරට යාමට සමර්ථ තොපට මෙයින් සත්වන දවස එනුවර රජකම් ලබන්නාහුය. එනුවරට යන මාර්ගය හරහා මහා වනාන්තර ඇත. එම වනාන්තරයෙහි මහත් උපද්‍රව ඇත. අමනුෂ්‍ය ග්‍රහණ ප්‍රදේශයකි. එම වනය මඟහැර යාමට යොදුන් සියයක්ද, වනාන්තර මැදින් එක එල්ලේ යාමට යොදුන් පණහකින් ගමන නිමකල හැක. එම වනාන්තරයෙහි වසන යකින්නියක්

එම වනය හරහා යනඑන අය නොයෙක් උපක්‍රමයෙන් පඤ්චකාමයෙහි බඳවා එහි ඇලුනේ ඔවුන් මරා කන්නේය. වනාන්තරය ඇතුලත යන එන්නවුන් මුලා කිරීම සඳහා නොයෙකුත් විසිතුරු විවේක ශාලා ගම් නියම්ගම් මවා නොයෙක් අලංකාර නිවෙස්ද මවා දිව්‍යාංගනාවන් මෙන් පෙනී සිටිමින් කාම බන්ධනයෙන් එහි ගමන් කරන පුරුෂයන් අල්වා වසඟ කරවා, මත් කරවා මරා කන්නේය.

රූපයට මත්වන සත්වයෝ බොහෝ සේ ඇලුම් කරන දිව්‍යාන්ගනාවන් මෙන් අඩ නිරුවතින් මත් කරවා ගනියි. ශබ්දයට නච්ඡ ගීතයට ආශා කරන ස්ත්වයෝ මිහිරි කටහඬ මවා සන්ගීතයෙන් මත්කරවා ගනිති. කට, දිව පිනවීමට කැමති සත්වයන්ට ඔවුන් ප්‍රිය කරන දේ පෙන්වා වසඟයට ගෙන මරාගෙන කති. ශරීර ස්පර්ශයට කැමති සත්වයන් මනාසේ සරසන ලද ඇඳ ඇතිරිළි ඇති කාමරවල සුවඳ විහුළුවා ඇඳමත යක්‍ෂණියන් මනා රූප ලාවන්න්‍යන්සේ අඩ නිරුවතින් වැතිරී පිරිමින් කාමරාගයෙන් මත්කරවා මරා කති. එම යකින්නියගේ මෙම රැවටිලි වලට අසු නොවී ඉන්ද්‍රිය සංවර කරගෙන නිරුද්පදිතව තක්සලා නුවරට ගියේ නම් එනුවර රාජ්‍ය ලබන්නාහයි, වදාළ සේක.

ඉන්පසු බෝධි සත්ව කුමාරයා ''ස්වාමීනි, ඔබ වහන්සේගේ අවවාදය මම පිළිගනිමි. එම යක්‍ෂණියන්ගේ උපක්‍රමවලට මම අසු නොවෙමි. මාගේ පඤ්ච ඉන්ද්‍රිය සංවර කරගෙන ඔබ වහන්සේ කල අවවාදයට අනුව එහි ගොස් රජකම ගනිමියි'' ප්‍රතිඥා දී පසේ බුදුරජාණන් වහන්සේ වෙතින් තම ආරක්‍ෂාව සඳහා පිරිත් පැන් සහ පිරිත් කරවා වැලි සහ නූල්ද රැගෙන තම දෙමාපියන් වැඳ නමස්කාර කරගෙන සමාව ගෙන තම මාළිගයට ගොස් සේවකයන්ට කියන්නාහු, මම තක්සලා නුවර රාජ්‍ය ගන්නට යමි. තොපි සිටුවයි, කීහ. සේවකයන් අතරින් පස්දෙනෙක් බෝසත් කුමරු සමඟ ගමනට එකතු වීමට

ආවේලේ තොපට මේ ගමන යාමට නොහැක. බොහොම අනතුරු ගමනකි. මිනීකන යක්ෂණියන් අධිගෘහිත වනාන්තරයක් හරහා යාමට තිබෙන්නේ එහිදී නොයෙක් ආකාරයේ උපක්‍රම මාර්ගයෙන් යන එන මිනිසුන් කාමරාගයෙන් මත්කරවා මරාගෙන කන්නේය. එම යක්ෂණියන් අධිගෘහිත වනය පසුකර යාමට කිසිම පුරුෂයකුට නොහැකි ආකාරයෙන් පඤ්චකාම බන්ධනයෙන් සිහින් මුර්චාකර අමු අමුවේම යන එන්නන් ගොදුරු කරගන්න නිසා තොප කිසිවෙක් මා සමඟ නොඒවායි, කී නමුත් එය නොපිළිගෙන කුමාරයන් වහන්සේ පසු පසම ගමනට වන්නහ.

බෝසත් කුමරුගේ අවවාද නොතකා පසු පස එන පස්දෙනා කුමරුන් සමඟින් එම යකින්නන් අධිගෘහිත වනාන්තරයට ඇතුල්වූහ. යකින්නියන්ද තම කටට එන ගොදුරු දෙස බලමින් මකුළුවා දැලට කුඩා සතෙක් පැටලෙන ලෙස දැල සකස් කර තිබෙන ආකාරයට පඤ්චකාමයෙන් එක් එක්කෙනා වැඩි වැඩියෙන් කැමති දේ මවා බලා සිටිති. පළමු වෙන්ම රූපයට ඇළුම් කරන පුරුෂයා හඳුනාගත් යකින්න මහත් ප්‍රියකරු තරුණ ස්ත්‍රියක විලාශයෙන් අඟපසඟ පෙන්වා ඔහු වසඟයට ගත්තේය. එම පුරුෂයා පසුබසිනු දුටු කුමාරයා පවසන්නේ ''තොප රවට්ටා ගැනීමට බලා සිටින යකින්න සිතට ධෛර්යය ගෙන ඒ දෙස නොබලා නොඇලී මා සමඟ එවයි'' අවවාද කලත් දෙපා රිදෙන නිසා මදක් නැවතී එමි, කියා මඟහැරිය පසු සෙසු යක්ෂණියන් සමඟ ඔහු මරාකා නොනැවතී යන පිරිස ඉදිරියට ගොස් නැවත පෙරසේම තූර්‍ය භාණ්ඩ වලින් (නච්ච ගීත) පිරුණු ශාලාවක් මවා ශබ්දයට ඇළුම් කරන පුද්ගලයා ගීතයෙන් මත්කරවා ඔහුත් අනුභව කොට ඉතිරි හතරදෙනාට ඉදිරියෙන් නැවතත් සුවඳ විහිදුවන ශාලාවක් මවා නොයෙක් වර්ගයේ සුවඳ වර්ග විහිදුවා බලා සිටියේය.

පෙරසේම ඇළුම්කරන පුරුෂයාටත් ඉතිරි දෙදෙනාටත් බෝසත් කුමරු අවවාද කලත් මොවුන් යකින්නියන් බව පැවසුවත්, අතුරුදහන්වූ දෙදෙනා මේ රූමත් කාන්තාවන් වශයෙන් පෙනී සිටින යකින්නියන් මරා කෑ බව පැවසුවත්, රසයට මත්ව ම අවවාද නොතකා නැවතුන පසු ඔහුද ගොදුරු කරගෙන පෙර සේම ඉදිරියෙන් අනේක ප්‍රකාර දිවයහන් පනවා උන්හ. එය දුටු ස්පර්ශයට වහල්වූ පුරුෂයාද මරා කා බෝසත් කුමරු තනිකර ගත්තේය. ඉන්පසු යක්ෂණී සිතන්නේ මෙම පුරුෂයා බොහෝ මෘදු මොලොක් කෙනෙක් නිසා මොහු මරා කාලා මිසක ආපසු නොයමි යි සිතා බෝසත් කුමරු පසුපසම ගියේය. මෙසේ වනයේ යන අතර ලී කපන්න ගිය පිරිසක් කුමරු පසු පස යන නාඹර රූමත් තරුණියගෙ වෙස්තග් යක්ෂණිය දැක. අර යන තරුණයා නැගනියගේ කවුද ? යි, ඇසූවිට ''අනේ අයියලා මම කුඩා කාලේ ඉදලම මට ආදරේ කරපු මා සහේටගත් මාගේ ස්වාමිපුරුෂයා'' යී කීවේය.

මිනිස් වෙසින් සිටි යකින්නිගේ කීම් විශ්වාස කල දඬු කපන මිනිසුන් තමා පසුපස එන මේ අහිංසක කෙල්ල අතරමන් නොකර දෙන්නා සමඟියෙන් යන්නැයි, අවවාද කලේය. එවිට බෝසත් කුමරු මැගේ වචන විශ්වාස කරන්න එපා මැය මා පසු පස මනුෂ්‍ය වේශයෙන් එන මිනී කන යකින්නියක් මා සමඟ එකට ආ මාගේ සේවකයන් පස්දෙනාම මෙම යකින්නිය කාලා දැන් මමත් මරාගෙන කන්න නොයෙක් වේශයෙන් එන්නේ'' යයි කියා ගියහ. තවදුරටත් දඬු කපන්නන් පසුකර යන ගමන් ගර්භණී ස්වරූපයයක් මවා පෙන්වමින් පිරිමි ගැහුණුන් සමඟ තරහ ගත්තාම ඔහොම තමයි, යක්ෂණිය, පේරේතිය, මූසලිය කීවාත් මේ මාගේ ස්වාමීපුරුෂයායි කියමින් ඉදිරියට යන අතර එක් දරුවෙක් ඉණේ වඩා තවත් දරු ගැබක් පෙනෙන ආකාරයට කුමරු පසුපසම ගියේය. යක්ෂණියද කුමරු මරා කාමිස ආපසු නොයමි යි සිතමින් පසු පසම තක්සලා නුවරටම ගියේය. ඉන්පසු යක්ෂණිය දරුවත් දරු ගැබත් අතුරුදහන් කොට නැවතත් නාඹර සුරූපිණියකගේ වෙස් ගෙන සැමටම පෙනෙන ලෙස සිටියේය.

මේ අතර කුමරු තක්සලා නුවර වාසල් දොරකඩ එක් ශාලාවක් ඇතුලට ගොස් සිටියේය. යකින්න එම ශාලාව ඇතුලට යාමට උත්සාහ කලත් කුමරුගේ පිනේ බලයෙනුත්, පසේ බුදුරාජාණන් වහන්සේගෙන් ලැබුනු පිරිත් පැන්, වැලි, පිරිත් නූල් නිසා යකින්නට ශාලාව ඇතුලට යාමට නොහැකි විය. එම අවස්ථාවේ තක්සලා නුවර රජතුමා උයනට යන අවස්ථාවේ ඇය දැක ඈ කෙරෙහි සිතක් පහළ වී රාජපුරුෂයන් ලවා ඇයගේ ස්වාමීපුරුෂයෙකු සිටිත්දැයි දැන එවයි, කියා යවා ඇයගෙන් විස්තර විමසීය. ඇය මෙසේ පැවසීය. මම කුඩා දැරිවිය කාලේ පටන් මාව ආරක්ෂා කරන මාගේ ස්වාමීපුරුෂයා අර ශාලාව ඇතුලේ ඉන්නේ යැයි කීවේය. එබස් ඇසූ බෝසත් කුමරු රාජපුරුෂයන්ට මෙසේ පැවසීය. මැය මාගේ බිරිඳ නොවෙයි. මා සමඟ පැමිණි මාගේ යහළුවන් පස්දෙනාම මරා කා මමත් මරාගෙන කන්නට පසු පස එන මිනිස් වේශයෙන් සිටින යක්ෂණියක් යයි කීහ. නැවත යක්ෂණිය මෙසේ කීවේය. පිරිමියෝ කේන්ති ගත්තම තම භාර්‍යාවන්ට කටට එන එන දේ කිය කියා බනින්නේ, යි කී පසු රාජපුරුෂයෝ එපවත් රජතුමාට දැන්වූ පසු අස්වාමික භාණ්ඩය අයිති රජතුමාට එමනිසා ඇය රැගෙන එවයි කී පසු ඇය ඇතුපිට තබා රාජමාළිගයට ගෙන ගොස් අගමෙහෙසි තනතුරෙහි තබා ගත්තේය.

රජතුමා සියළුම කටයුතු නිමවා සුවඳ පැනින් නා පිරිසිදු වී ශ්‍රී යහන් මස්තකයට නැගී සැතපුනේය. යකින්නද තමන්ට සුදුසු ආහාරයක් ගෙන කා, ස්වර්ණාභරනයෙන් සැරසී සුවඳ විලවුන් ගල්වා රජතුමා සමඟ සැප විඳ එක් ඇලයකට පෙරළී අඬන්නට වූහ. රජතුමා ඇය කෙරෙහි මහත්සේ පැහැදී සොඳුර තී කුමක් නිසා අඬන්නෙහිද? මහ රජතුමනි, මම නුඹ වහන්සේ විසින් මගදී දැක මෙහි ගෙන එන ලදී. ඔබවහන්සේ අන්තඃපුරයෙහි බොහෝ ස්ත්‍රීහු සිටිති. මම සම්පත්තීන් අතුරේ වසන්නෙම් කථාවක් ඇතිවූ විට තිගේ මව්පිය, ජාති, ගෝත්‍ර, දන්නේ කවුද? මගදී දැක හඳුනා ගෙනා තී කී කල්හි මම කරබා

සිටිය යුතුයි. එමනිසා නුඹවහන්සේ සියළු රාජජේශ්‍යයන් ආඥාවත් මට ලබා දුන්නොත් මාගේ සිත රිදෙන්න වචනයක් කියන්නට කිසිවෙකුටත් බැරිය. එවිට රජතුමා කියන්නේ ප්‍රිය සොඳුර මට සියළු රාජ්‍යවාසීහු නැමෙන්නේ නැත. මම උන්ට නායකයෙකු නොවෙමි. යමෙක් රාජාඥාව කඩකොට නොකටයුතු දෙයක් කෙරෙත්ද, ඔවුන්ට මම නායක වෙමි. මෙම හේතුව නිසා තිගේ ඉල්ලීම ඉටුකල නොහැක. එසේනම් මහරජතුමනි, මෙම මාළිගාවෙත් අන්තඃපුරයෙහිත් සිටින සත්වයන් කෙරෙහි මාගේ ඉසුරු පවත්නා ලෙස රාජආඥාව දෙන සේක්වායි ඉල්ලා සිටියේය.

එවිට රජතුමා ඇයගේ කාම බන්දනයට මත්වී සිටි නිසා ඇගේ එම ඉල්ලීමට එකගව මෙවක් පටන් තී මෙම අන්තඃපුරයෙහි සිටින්නාවූ සත්වයන් කෙරෙහි තිගේ ආඥාව පතුරවයි, අවසරයදී සිටියේය. එවිට යක්‍ෂණියද යහපත,යි මහරජතුමනි කියා නැවතත් රජතුමා කාමරාගයෙන් මත්කරවා නිදිකොට අමුනුෂ්‍යපුරයට ගොස් සෙසු යක්‍ෂණියන්ද කැටුව රාජමාළිගයට අවුත් පළමුව රජතුමා මරා කා ඇටකටු පමණක් ඉතිරිකොට දෙවනුව අන්තඃපුරයට වැද එහි සිටි සියල්ලෝම මරා කා ඇටකටු පමණක් ඉතිරිකොට ඉන්පසු මාළිගාවේ සිටින කුකුළන්, එළුවන්, බල්ලන්, මුරකරුවන් ආදී කිසිවෙකුත් ඉතිරිනොකට මරා කා පහන්වීමට පෙර සීමාවට ගියහ. ( යක්පුරය) පසුදින රාජමාළිගාවේ වැසූ දොරවල් විවෘත නොවී නිසොල්මන්ව තිබෙනු දැක ජනයා එකතුව යකඩඉණි සහ පොරොවන් උපයෝගී කරගෙන දොරවල් පලා වවෘත කර බැලූ විට සිදුවී තිබෙන විනාශය දැක පෙරදින වාසල් දොරකඩ ශාලාවේ සිටි තරුණයා කී දෙය සැබෑවක්ම තමයි සිතා රජතුමා ඇයගේ රූපයට මත්ව ඈ වසඟයට ගත් විපාකයයි සිතා බෝසත් කුමරු එදින රෑ පහන්වනතුරු ශාලාව වටා පිරිත් නූල් ඇද පිරිත් කරන ලද වැලි ඉස තම කඩුව අතේ සූදානම් කරතබා පහන්වනතුරු නිදිවර්ජිතව සිත ධෛර්‍යය සම්පන්න කරගෙනම සිටියේය.

එහි මිනිසුන් රජමාළිගාව අන්තඃපුරය තුල විසිරී තිබූ මිණි ඇටකටු ඉවත්කර පිරිසිදුකොට සුවඳ පැන් ඉස පහන් දල්වා පෙර තිබූනාටත් වඩා අලංකාරවත් ලෙස සියල්ල සකස්කොට සැවොම එක්ව රජකෙනෙකු පත්කර ගැනීම සඳහා සාකච්ඡා කලහ. එවිට එක් ඇමතියෙක් ඉදිරිපත්වී මෙසේ යෝජනා කලේය.

යම් පුරුෂයෙක් දිව්‍යමය කාමරූප මවාගෙන පසු පස එන යක්ෂණිය හඳුනා ඇය කෙරෙහි මඳ බැල්මක් පවා නොකොට ඇගේ ග්‍රහණයට අසුනොවී සිටින එඩිතර උදාර තරුණයා අපගේ රාජ්‍යට ඉතාම සුදුසුයි. එවන් උත්තම පුරුෂයකු පාලනය කරන රටකට මෙවන් විපත් නොවන්නේය. යහපත, සෞභාග්‍ය උදාවන්නේය. එම නිසා ඒ වීර පුරුෂයා අපගේ රජතුමා වශයෙන් පත්කර රාජ්‍යය බැබලීම ගෙනදෙයි. එම නිසා ඒ සූරවීර කුමාරයාම අපේ රජතුමා වශයෙන් පත්කර ගනිමු යී යෝජනා කලේය. එම යෝජනාව එහි සිටි සියල්ලෝම ඒකච්ඡන්දව බෝධිසත්වයන් කරා පැමිණ, දේවයන් වහන්ස, ඔබවහන්සේ මෙම රාජ්‍යයෙහි රාජශ්‍රී අනුභව කොට වදාල මැනවයි කියා නුවරට කැඳවාගෙන ගොස් රුවන් රැසක් මත සිටවා අභිෂෙකකොට තක්සලා නුවර රජු බවට පත්වූහ. එම බෝසත් රජතුමා පක්ෂග්‍රාහයෙන්ද, වෛරයෙන්ද, මාන්නයෙන්ද යුතුව රාජකාරියක් නොකරන හෙයින් සතර වැදෑරුම් අගතිගාමය නැති කොට දසරාජ ධර්මයෙන් දැහැමින් රාජ්‍ය කොට දානාදි පින්කම් කොට සිහිනුවණින් යුතුව මිය පරලොව සුගතිගාමී විය. තිලෝගුරු සම්මා සම්බුදුරාජාණන් වහන්සේ මෙම අතීත කථාව ගෙන හැර දක්වා භික්ෂූන්ට අවවාද කරන සේක්.

මහණෙනි, අතෙහි පිහිටි රේඛාව සේ සමව පිරුණාවූ තෙල් භාජනය තෙල් බිඳකුදු බිම නොසලා යම් පුරුෂයෙක් ගෙන ගියේද, එපරිද්දෙන්ම තමාගේ සිත, කය, ගත හා සතියෙහි පිහිටා ඉතා සුළු වරදෙහිත් නොයොදා ශීලසම්පත්තියේහිම පිහිටා නුවණැත්තාවූ

යොගාවචරතෙමේ ස්වකීය වූ සිත ආරක්‍ෂා කරගන්නේය, ඒ කුමක් පිණිසද යත් ඉතා භියකරු වූ, දුක්ඛිත වූ, අනවරාග්‍ර සංසාරයෙහි කිසියම් බාල පෘතග්ජන කෙනෙකුන් විසින් සිහිනෙන් පවා නොගිය නිර්වාණ නැමති එකම සැනසිල්ල ප්‍රාත්‍ථනා කරන්නා හු විසින් කර්මස්ථානයෙහි සෑම වේලේහිම ක්‍රියාකල යුතුද එසේ යම් කෙනෙක් නිවන් දකිනු කැමති නම් තෙල් පාත්‍රය ගෙනගිය පුද්ගලයා ජීවිතාශාවෙන් ක්‍රියාකල ආකාරයට ක්‍රියාකල යුතුයි. එම සත්වයා තෙල් බඳුන දෑතට ගත්වේලේ පටන් වෙන කිසි අතකට සිත ඇදී යාමට නොදී තමාගේ අභය භූමිය දක්වා තම සිත ආරක්‍ෂා කරගෙන ගිය ආකාරයට යොගාශ්‍රයාද තමාගේ එකම අරමුණු දුක් සසර ගමන නිමා කිරීමට ක්‍රියා කල යුතුයයි, වදාල සේක.

මෙසේ ඒ අපගේ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නිර්වාණ ධර්මයෙන් දේශනාව පණගන්වා මෙම තේලපත්ත ජාතකය නිමවා වදාල සේක.

## පසුවදන

වාසනාවන්ත පින්වත්නි, මෙම තෙලපත්ත ජාතක කථා වස්තුව බණ පොතෙහි තිබෙන කෙටිම එහෙත් ගිහි පැවිදි අප කාහටත් මහඟු ආදර්ශයක් දෙන උතුම් කථා වස්තුවක් බව මෙකී කථා වස්තුව කියවා තේරුම් ගත්තා නම් අපි සැම සියළු කෙනෙකුගේම තිබුණු තිබෙන අඩුපාඩු වැරදි හදාගෙන මේ මුලක් අගක් නොපෙනන දුක් සසරින් මිදීම නොහොත් නැවත නැවත මැරී මැරී ඉපදී ඉපදී යන ගමන නවතා ගනිමු.

අපි සිතන පතන දේවල් අපට නොලැබීමෙන් ලැබෙන දුක්, ප්‍රියයන්ගෙන් වෙන්වීමෙන් ලැබෙන දුක්, අප්‍රියයන් හා එක්වීමට වීමෙන් ලැබෙන දුක්, නොයෙකුත් ලෙඩ රෝග හේතුකොට ගෙන එයින් විඳින අපහසුතා දුක්, උස් පහත් කුල ගෝත්‍ර ජාති වශයෙන් ඇතිකරගන්නා වූ ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පළිගැනීම් හේතු කොට ගෙන හිත් දූෂණය වීමෙන් මරණයෙන් පසු දිගු කාලීනව සතර අපාගත වීමෙන් විඳවන අපමන ඉතාබියකරු දුක් වේදනා සිහිපත් කරගෙන මෙම ඉතා අගනා ජාතක කථා වස්තුව කියවා බලා අපි අනුන්ගේ වැරදි යටගියාවන් නොසොයා සහ සිහියට එන දේ ආදර්ශයට ගෙන අපේ වැරදි අන්‍යයන්ට පෙන්නන්ට නොව අපේම යහපත පිණිසත්, මරණයට සූදානම් වත්, ඊලඟ භවය නොහොත් උත්පත්තිය දුගතියෙන් තොරව සුගතිගාමී වීම පිණිස මෙම බුද්ධ ශාසනයෙහිම නිවන් දකින්න ලැබුනොත් හොඳයි නොලැබුනොත් මෙම කල්පයේ ඉදිරි අතුරුකප ලෝ පහලවන පස්වන නොහොත් අන්තිම බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙන් සසර දුකෙන් මිදීම පිණිස ක්‍රියාකර ගැනීම කාට කාටත් සැනසිල්ලක් කර ගැනීම සඳහා එහි මුල් පියවර වශයෙන් පඤ්ච ශීලයට අයත් එකම සිල්පදයක්වත් කඩ කරන්නේ නැතිව ආරක්‍ෂා කරගැනීමට අදම අධිෂ්ඨාන කරගෙන වාසනාවන්ත සිල්වතකු වන්න දිරිය ගන්නා මෙන් පින්වත් ඔබ සැමට මම ඉතා කරුණාවෙන් පෙන්වා දෙන්නේ අද සමාජය දිහා බලන කල පෙනෙන ඉතා දුක්ඛිත සිද්ධීන් දිනෙන් දින බහුල වීමෙන් සොබාදහම විකෘති වී තිබීමත්, උපදින පරම්පරාවන්, ආත්මාර්ථකාමී තත්වයට යමින් පව, පිණ සතර අපා පිළිනොගැනීමෙන්, කර්මඵල ඇස් පනාපිට පෙනුනත් එය විශ්වාස කිරීමට තරම් පුණ්‍ය වාසනාවක් නොමැති සංවේග මනුෂ්‍ය ජීවිත පෙනෙන නිසාය.

## විශේෂ ධර්ම දේශනාව

දිය, ගොඩ, අහසේ වසන අප්‍රමාණ සත්ව වර්ගයා අතරින් මිනිසා කියන සත්වයාම මහා බුද්ධිමතෙකි. බුද්ධියෙන් ඉහලම තත්වය වූ ලොව්තුරු සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේද මුනුෂ්‍යයෙකි. එය එසේ නම් මිනිසුන් වශයෙන් අපිත් සිතට වහල් නොවී පක්ෂග්‍රහ නොවී බුදු දහමෙන් පෙන්වාදෙන අපට සිතාගන්න බැරි එහෙත් සත්‍ය ධර්මයක් මේ තේලපත්ත ජාතකයෙන්ද පෙන්වා දෙයි. එනම් මනුෂ්‍ය වේශයෙන් අප අතරම ගැවසෙන සිටින යක්ෂ, ප්‍රේතයන් ගැන ඔවුන්ම තමා මීට අවුරුදු දෙදෙහස් පන්සීයයකට පෙර එදා විශාලා මහනුවර තුන්භියක් ඇතිකර අමු සොහොනක් බවට පත්කලේ ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටි නිසා දේවතාවන්ගේ මගපෙන්වීම අනුව එනුවර වැසියන් බුදුරජාණන් වහන්සේට ආරාධනාකර වැඩමවා ගංගා නම් ගඟින් එතරව එනුවරට දකුණු ශ්‍රී පාදය තබනවාත් සමගම එහි සිටි දරුණු ගණයේ යකුන්, යක්ෂණියන් පොළොවේ පය ගසා සිටීමට නොහැකිව පැන ගියේය.

එහෙත් ඒ අතර සිටි අල්පේශාඛ්‍ය යකුන් යකින්නියන් ප්‍රේතියින් පැනගත නොහැකිව තැන තැන සැඟවෙමින් දරුණු පාපකර්ම කරන පුද්ගලයන්ට ආරූඪ වෙමින්ද (මෑත කාලයේ වශයෙන් උඩ වලවේ සිවු මිනී මැරුමට සම්බන්ධ අයද, බියගම විලේජ් එකේ පියා මැරූ පුත්‍රයාද, රත්මලාන ගොළුමඩමේ බිරිඳ සහ දරුවන් ගිනි තබා මැරූවන්ද, නයින මඩමේ දත් දොස්තර නෝනා ඇතුළු පවුල මැරූ අයද, එම වෙලේම තවත් එවන් මරණයක් කල අයද, විශේෂයෙන් **කොටකෙතන** සිදුවූ අපරාදකරුවන් වගේ ශරීරවලට ආරූඪවන අමනුෂ්‍යයන් වැනි) අය සිටිනු දුටු බුදුරජාණන් වහන්සේ ආනන්ද මහතෙරුනුවන් වහන්සේ කැඳවා රතන සූත්‍ර පිරිත උගන්වා පිරිත් පැන් සහ පිරිත් කල වැලි විශාලා මහනුවර සෑම තැනම ඉසින විට පිරිත් පැන් වදින අමනුෂ්‍යයෝ පාපකාරී පුද්ගලයන්ගේ ශරීරවලින් ඉවත්ව පැන ගියහ. එසේ පැනගිය ඔවුන් පිරිත් කරන ලද වැලි පෑගෙන විට ගිනියම් වූ යකඩ පෑගෙන්නාසේ රැඳී සිටීමට නොහැකිව පැන ගියහ.

අද අපේ රටටද මිථ්‍යාදෘෂ්ටි රට රාජ්‍යයන්ට සමාන ආකාරයට මෙම තුන්බිය උදාවී තිබෙන්නේ බෞද්ධ විරෝධි මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ ග්‍රහණයට අසුවී තිබෙන්නේ අපගේ නැහැදිච්ඡකම නිසා බව අමුතුවෙන් කිවයුතු නැත. **මොකක්ද? නැහැදිච්ඡකම** පස්පවු, දස අකුසල්, නොකටයුතු වෙලදාම්, ආත්මාර්ථකාමීත්වයම පතන ඇතිඑකා මාන්නයෙන්ද, නැතිඑකා ඊර්ෂ්‍යාවෙන්ද, සෑම තැනම සූදුව ලොතරැයි ටිකට්පත්, රජයේ අනුග්‍රහයෙන් කෙරෙන සුරාව, සූදුව, ගණිකා වෘත්තියේ යෙදෙන්න මෙරට කාන්තාවන්ට මඟ සලසා තිබීම, රජයේ අනුග්‍රහයෙන්ම මන්දපෝෂණයට පිළියමක් වශයෙන් දිය, ගොඩ සත්ව ගොවිපලවල් පාලකයන්ගේ දුරාචාර ගති විශේෂයෙන් පසුගිය රජය කරගෙන ආ කැසිනෝ ජාවාරම සහ වන අලි සංහාරය හා මහපරිමානයේ හෙරොයින් ජාවාරම එයට අනුබල දුන් පසේනදි කොසොල් රජතුමා දුටු 11 වන සිහිනයට සම්බන්ධ දුශ්ශීලයන් බලවත් කරවීම.

එසේම එදා බුදුරාජාණන් වහන්සේ වැඩ සිටියදී බුදු රාජාණන් වහන්සේට විරුද්ධව ක්‍රියා කරන ලද හයකුලයට අයත් නිගණ්ඨනාථයන්ට හිටපු පිරිසට දෙවෙනි නොවන මෙකී නොකී පහත් වැඩ කරපු දේශපාලකයන් තව තවත් එහෙයි කියන මිනිස් වේශයෙන් සිටින දේශපාලකයන් අදහන තිරිසන් ගති ඇති මිනිසුන්ද ඇති නිසා දිනෙන් දින තව තවත් ඉදිරියට මේ රට විනාශයට පත්වන්නේ පසේනදි කොසොල් මහ රජතුමා දුටු 10 වන සිහිනය අනුව බව තේරුම් ගන්න වැඩි විස්තර සඳහා කොසොල් මහ රජතුමා දුටු සිහින 16 පොත කියවන්න.

වර්තමානයේ භික්ෂුගරුත්වය බැස තිබෙන්නේ සිල්වත් භික්ෂූන් වහන්සේලා දැඩි අපහසු තත්වයට පත්වී තිබෙන්නේද, ධර්මය යටපත් වන්නේද, අධර්මය ඉස්මතු වන්නේද, ධර්මය විකෘති වන්නේද, ධර්මය අසන්නට විචිකිච්ඡාව ඇතිකර ඔවුන්ට නීවරණය කරන්නේද මෙකී දුශ්ශිලයන් බවම මතකයට ගන්න. දුශ්ශීලයෝ කවුද? කියා මම පෙන්විය යුතු නැත. පන්දහසක් අවුරුදු පවතින සම්බුදු ශාසනයට එක දුශ්ශීලයෙක් එක්වීම ලක්ෂයක් භික්ෂූන් දුශ්ශීලභාවයට පත් කිරීමකි. ආත්මාර්ථකාමීත්වයෙන් යුතුව උපාසක ලීලාවෙන් තමන්ගේ බඩ ගැන පමණක්ම සිතා එම දුශ්ශීලයන්ට අනුග්‍රහ දක්වන්නෝද මෙම ශාසන

පරිහානියට වගකිව යුතුයි.

එසේම පැවිදි භාවය ආරක්ෂා කරගැනීමටද බොහෝ සෙයින් කරදර පීඩා විදිය යුතුයි. පැවිදිවීම පහසුය. පැවිදි භාවය ( සිල්වත් බව) රැක ගැනීම අසීරුය. එමනිසා තමයි බොහෝ සෙයින් සිවුරු හැරයන්නේ. ඉතා දුකසේ නමුත් තමන්ගේ ශ්‍රමණ සාරුප්පිය ආරක්ෂා කරගෙන ගියොත් මෙලොව පරලොව දෙකම ජයගත්තා වෙන බව සිතන්න සිවුරු හැරගියාට පසුව ඉතා කෙටි කාලයකින්ම පසුතැවෙන්න වන්නේ පිණ මද නිසාය.

එසේම මෙම තේලපත්ත කථා වස්තුවෙන් පෙන්වාදෙන ආකාරයට එදා බෝසත් කුමාරයාට රජකම නොලැබෙන නිසා යොදුන් සියයක් දුර රාජ්‍යයකට යාමට වූයේද රජසැප විදින්නට නොව රටවැසියන් යහමගට ගෙන තමන්ගේ මෙලොව පරලොව යහපත තකායි. වර්තමානයේ කරදර දුක් පීඩා විද දරාගෙන අපවත් මෙම කථා දූන ඉගෙන ජීවිත යහ මඟට ගෙන පඤ්චකාමයට ඇලුම් නොකර සසර දුකින් මිදීමට සිතන්න.

සෝවාන් ඵලයට පැමිණි සිටු කුමරියත් සතුන් මරණ වැදි පුත්‍රයෙක් සමඟ පවුල්කාපු කථාවක් ආදර්ශයට ගන්න. එසේම තේලපත්ත ජාතකයෙහිදී පමණක් නොව සසර ගමණ නිමා කල අවසන් ආත්මභාවයෙත් පාරිලෙයිය වනයේ ඇත් රජකුගෙන් උපස්ථාන ලබමින් වැඩ සිටීමට සිදුවුනා නම් අපි ඒවාත් ආදර්ශයට ගෙන අපගේ ගමන නිවන දක්වාම නොපසුබටව යාමට උත්සහා වන්න.

## අනුවේදනීය කතාවක්

දිනය 1999 ඉකුත් දෙසැම්බර් 21 වැනිදා, වේලාව රාත්‍රී 2යි. එදා රාත්‍රියේදී එකත්රා ව්‍යාපාරිකයෙකු සතු වූ ලොරියක් තිස්සමහාරාමයේ සිට අගනුවර දක්වා ධාවනය වෙමින් තිබිණ.
කිටි කිටියේ ලොරියේ ගාල් කර තුබුණේ මස් පිණිස මරන්නට නියමිතව සිටි ගවයින් 25 දනෙකි. මී ගවයන් 16 ක්ද එළ ගවයන් හා එළ දෙනුන්ද ඒ අතර විය. සතියකට පමණ සිට කතරගම දෙවිඳුගේ අණසක පවත්නා රුහුණු රට තිස්සමහාරාම චෛත්‍ය පෙනෙන නොපෙනෙන මානයේ ලදු කැලෑවක මෙම ගවයන් සමූහය ගස් බැඳ ගෙන තිබුනි. 20 දා රාත්‍රියේ ලොරියට පටවන විටත් ගවයන් සිටියේ සතියක් පුරා නිසි කෑම වේලක් තබා උගුර තෙමන්නට වතුර පොදක්වත් නොමැතිවය. හෝමාගමට පැමිණි ලොරිය 21 දා රාත්‍රී 2ට පමණ ගමනාන්තයට ආසන්න වෙමින් දියගම හන්දිය අසළ මාර්ග බාධකයට ලඟා විය.

මීළඟ කථා පුවත අපි කහතුඩුව පොලිසියේ අපරාධ අංශයභාර පොලිස් පරීක්ෂක ශ්‍රී ලාල් ප්‍රේමතිලක මහතාගෙන් අසා දැන ගනිමු.

එදින රාත්‍රී 2 ට පමණ මගේ ප්‍රධානත්වයෙන් පොලිස් පිරිසක් දියගම මාර්ග බාධකය අසළ රැඳී සිටියා. පළමුවෙන් හයිඑස් වර්ගයේ වෑන් රථයක් ආවා. සෙල්ටෙල් දුරකථනයක් අතැතිව සිටි තරුණවියේ පුද්ගලයාගෙන් මම ප්‍රශ්න කලා. ව්‍යාපාරික කටයුත්තක් සඳහා දුර බැහැර ගොස් එන බවක් හැඟවුවා. බරපතල සැක සහිත තත්වයන් මතු වූයේ නැති නිසා මම එම වාහනයට යන්නට අවසර දුන්නා. එවිටම වාගේ පැමිණි ලොරිය අප ගැන තැකීමක් නොමැතිවම ඉදිරියට ගමන් කළා. මම වහාම සංඥාවක් දී නතර කැරවුවා. ඉදිරියෙන් ගිය වාහනයේ හිටියේ තම ප්‍රධානියා යයි ලොරි රියදුරා කිව්වා. ඔහු අතත් දුරකථනයක් තිබුණා. ඒ මඟින් කිසියම් අයෙකුට පණිවිඩ දෙන බව මම තේරුම් ගත්තා. ඒ වන විට මගේ සහායකයින් ලොරිය පිරික්ෂා කළා. අත් පා හතර එකට බැඳුණු ගවයන් එකා පිට එකා වැටෙන සේ දමා තිබුණා. මී ගවයන් කිහිප දෙනෙකුගේ හොම්බ ලොරියේ වහලයේ සිදුරකින් අහසට ඔසවා බෙල්ල දම්වැලකින් යකඩ පටියකට තද කර බැඳ දමා තිබුණා.

එක එළදෙනකගේ ඇඟ උඩට මී ගවයන් දෙදෙනෙක් දමා තිබුණා. එකෙකුගේ අං දෙක තවත් එකෙකුගේ ඇස් පසාකර ගිහින් බලන්න බැරි ශෝචනීය දර්ශනයක් ඒ....

ඊ ළඟට කථා කලේ කහතුඩුව පොලිස් ස්ථානාධිපති ඩී.ඒ. කරවිට මහතාය.

ගවයන් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනාව කැස්බෑව අධිකරණයට යොමු කළා. නිත්‍යානුකූල බලපත්‍ර ලබාගෙන ගවයන්ට හිංසාවක් පීඩාවක් නොවන සේ ලොරි කිහිපයකින් ප්‍රවාහනය කළයුතුයයි සැකකරුවන්ට නියෝග කළා. ගවයන් සමූහය තාවකාලිකව හොරණ සත්ව ගොවිපලකට භාර දෙන්නට නියෝග කලත් එම ගොවිපලේ පහසුකම් නැති නිසා භාර ගැනීම ප්‍රතික්ෂප කලා.

කිසි කෑමක් බීමක් නැකි ගවයන් පොලිසියේ ගස් බැද ගෙන හිටියා. උන්ගේ ඇස් වලින් ගලා ගියේ උණු කඳුළු කැට අත් පා කැඩී ගිය සතුන් දෙදෙනෙක් දැඩි ලෙස පීඩා විඳිමින් හිටියා. ගවයන් බොහෝමයකගේ තුවාල තිබුණා. පොලිසියේ බොතේජු ළමයා ඉඳහිට වතුර ටිකක් තණකොළ ටිකක් දුන්නට එය කිසිසේත්ම ප්‍රමාණවත් වුනේ නැහැ. 26 දාට එළි වෙන කොට එක් එළදෙනෙක් මැරී සිටියා. ලේක්හවුස් පුවත්පත් වාර්තාකර මහතා පැමිණ කළයුතුදේ විමසුවේ මේ අවස්ථාවේ.

මේ සත්ව මිත්‍ර සංවිධානයේ සභාපති සාගරිකා රාජකරුණානායක මහත්මිය කියන කථාවයි..

අපි යන කොට ඒ සතුන් බලාගෙන හිටියේ තමන්ව මරණයෙන් බේරගන්න එන්නෙ කවුද කියලා වෙන්න ඇති. ඔවුන් හඬ නොගහා දෑසින් බැගෑපත් වුණ් අනේ අපිව බේරගන්න කියලයි. මේ වෙන කොට ඒ සතුන්ගේ ඇගේ මස් දියවෙලා තියෙන්න ඇති. උන් විඳි වේදනාව මට තදින්ම දැණුනා. මම ලූෂන් රාජකරුණානායක මහතාත් සමඟ සතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගන්නට තීරණය කලා.

අලුත් අවුරුද්දේ ජනවාරි 5 දා අපි අධිකරණය හමුවට මෝසමක් මගින් කරුණු ඩදිරිපත් කළා. විනිසුරුතුමාට ඡායාරූප පෙන්නලා සතුන්ගේ වේදනාව කෑ ගහල කිව්වා

සුමිත් පෙරේරා, බෝධිනාගොඩ යන නීතීඥ මහතුන් එක හෙළාම කියා සිටියේ යුක්ති ධර්මයේ නාමයෙන් ඒ ගවයන්ට අභයදානය දෙන්න කියලයි.

ජනවාරි 12 දා ගවයන්ට අභයදානය දෙන්නට විනිසුරුතුමා තීරණ කලා. ඒ මෑත ඉතිහාසයේ ප්‍රථම වතාවට අධිකරණ නියෝගයක් මත ගවයන් සමූහයකට අභය දානය දෙන්නට නියෝගයක් දෙන්නට ඉඩ ලද ඓතිහාසික අවස්ථාවක්. සැකරුවන්ට මාස 6 ක බරපතල වැඩ ඇතිව සිර දිඩුවම් නියම කරමින් විනිසුරුතුමා කිව්වේ මීට වඩා දැඩි දඬුවමක් දෙන්නට නොහැකි වීම ගැන අධිකරණය දුක් වෙනවා කියලයි.

ජනවාරි 15 දා ගවයා පූජනීය වස්තුවක් කොට සලකන හින්දු බැතිමතුන්ගේ උත්සවය දිනයක්, කහතුඩුව පොලිසිය එදා පන්සලක් වුනා කිව්වොත් නිවැරදියි. පොලිසිය පුරා බෞද්ධ කොඩි ඔසවලා කිව්වේ අවිහිංසාවේ ගුණ සුවඳමයි. ඉදිරිපිට වෙල්යායත් වෙනදා නොමැති නැවුම් ප්‍රබෝධයක් ලබා තිබුණා.

කහතුඩුව ශ්‍රී නන්දනාරාමාධිපති කහතුඩුවේ විමලතිස්ස ලොකු හාමුදුරුවෝ අවුරුද්ද ලබන කොටම කර ගත්තු පින ආත්ම ගණනාවක් සුගතියට හේතු වෙනවයි කියලා දිග අනුශාසනාවක් කලා

පොලිස් ස්ථානාධිපතිතුමා කිව්වේ ගව ඝාතනය අවම කරන්න නම් ගව මස් කෑම සීමා කළ යුතුමයි කියලා.

පොල්ගස්ඕවිට සමූහ
සෝමරත්න පන්නිල.

**1. මහා මංගල සූත්‍ර දේශනාව**

පූජණීය ලග්ගල කල්‍යාණවංස හිමිපාණන් වහන්සේගේ අවවාද උපදෙස් අනුව කාලානුරූපව සකස් කරන ලද පළමුවන දහම් ග්‍රන්ථයයි.

**2. යශෝධරා කථා වස්තුව**

ස්ත්‍රී පුරුෂ දේපාර්ශයේම සිත් ඇදී ගිය කථා වස්තුවකි. ක්‍රිස්තු වර්ෂ 2007 සිට 2015 මාර්තු දක්වා 6 වාරයක් නැවත නැවත මුද්‍රණය කරන ලදී. මෙහි මූලික අනුග්‍රහය අතුරුගිරියේ පදිංචි රාජගිරියේ හේවාවිතාරණ විද්‍යාලයේ ගුරු ආචාරිණී රමණි කාරියවසම් මහත්මය ගේ අනුග්‍රහයෙනි.

**3. චන්ද්‍රාලෝකය**

(පායාසිරාජඤ්ඤ සූත්‍රය) නැමැති දහම් ග්‍රන්ථය 2008.12.18 වැනි දිනට සුබ උපන් දිනයක් සැමරූ අපගේ ගුරුදේව පූජණීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේගේ 43 වන උපන් දිනය සමරා වැල්ලවත්තේ ධර්මදීප ස්වාමීන් වහන්සේගේ ඥාතීන්ගේ අනුග්‍රහයෙන් මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

**4. තෘෂ්ණාව**

මිහින්තලය ප්‍රදේශයේ නත්තල් උත්සවය වෙනුවෙන් එළුමස් නමින් විකිණීමට වසු පැටවුන් 30 ක් රැගෙන ගිය වාහනයක් පොලිස් අත්අඩංගුවට ගෙන එම සතුන් නිදහස් කරන ලද පොලිසියට ස්තුති කිරීමක් වශයෙන් මුද්‍රණය කර බෙදා හරින ලදී.

**5. හත්ථිපාල ජාතකය**

විදේශගතව සිටි පින්වත් මහත්මයෙකුගේ සහ තවත් දායක පිරිසකගේ අනුග්‍රහයෙන් 18.12.2012 දින පූජනීය වන්දනීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේගේ 47 වන උපන් දිනය සමරා මුද්‍රණය කර බෙදා හරින ලදී.

## 6. සෝසක සිටානෝ

අගනා දහම් ග්‍රන්ථය මාගේ ඥාතීන්ගේ අනුග්‍රහය ඇතිව පූජනීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේගේ 47 වන උපන් දිනය වූ 18.12.2013 දින මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

## 7. මෙණ්ඩක ප්‍රශ්නය

ශ්‍රද්ධාවත් උපාසක උපාසිකාවන්ගේ තිබිය යුතු භික්ෂු ගරුත්වය සහ මෑත කාලයේ තබන බුද්ධ පූජා, වැඳුම් පිඳුම් වල පව පින නැතැයි සිතන කියන මිථ්‍යාදෘෂ්ටිකයන්ට සහ තම ශිෂ්‍යන් කෙරෙහි ගුරුවරයෙකුගේ තිබිය යුතු යුතුකම් පෙන්වාදුන් පොතකි. මෙම පොත තිස්සමහාරාමයේ කාවන්තිස්සගම ඥානාරාමයේදී 01.02.2013 දින ප්‍රසිද්ධ කරන ලදී.

## 8. කර්ම දායාද

සුනාමියට අනුවී මියගිය සහෝදරයාට පින් පතා හම්බන්තොට බුන්දල විසූ දායිකාවකගේ සහ වෙනත් ලැබුනු මුදල් උපයෝගී කරගෙන වැල්ලවායේ ප්‍රාදේශීය සභාපති රෝහණ වන්නිආරච්චි මහතාගේ සත් ක්‍රියාවක් අගයා නිරය ගැන විස්තරයක් ඇතුලත් මෙම පොත මම බුන්දල ශ්‍රී විසුද්ධාරාමයෙහි වැඩ සිටි 10.04.2013 අවුරුද්දේ මුද්‍රණය කර බෙදා හරින ලදී.

## 9. දහම් සරණ

මෙම දහම් ග්‍රන්ථයේ මුල් පිටපත ක්‍රිස්තු වර්ෂ 2007 අවුරුද්දේ ගල්දූවේදී මට හමුවී එය කියවා බැලිමේදී ක්‍රිස්තු වර්ෂ 1931 අවුරුද්දේ කොළඹ වේල්ල වීදියේ මුද්‍රණය කර එවකට පිටපතක් ශත 45 ක් වශයෙන් මිලකර තිබුනි. එය දිරා ගිය කාවුන් විසින් කා දමාද දිරාපත්වයටද පත්ව තිබී දැඩි උවමනාවෙන් නැවත පිටපත්කර මුද්‍රණය සඳහා අනුග්‍රාහක ශක්තියක් නොමැතිව සිටියදී ක්‍රිස්තු වර්ෂ 2013 අවුරුද්දේ ගම්පහ උග්ගල්බොඩ ධර්මාරාම යෝගාශ්‍රමයෙහි වස්වසා සිටියදී මා වෙත උපකාරයක් කිරීමට සූදානම් වූ පින්වත් දෙවොලපොල පදිංචි උපාලි අමරතුංග මහතා සහ

එම මැතිණිය වන ලක්‍ෂමී අමරතුංග මැතිණියගේද ධන පරිත්‍යාගයෙන් අභාවයට යන ඉතා වටිනා දහම් ග්‍රන්ථය නැවත බෞද්ධයන් අතට පත් කෙරුනි.

එසේම එම පොත කියවා තිබෙන මීනුවන්ගොඩ මැඩැමුල්ල පදිංචි උපාලි ගුණසේකර මහතා හා අමිතා විජේසිංහ මැතිණිය (මව, පියා) විසින් අකාලයේ මියගිය (24.01.2013) තම දියණියට පින්පතා සියළුම දානයන් අභිබවා යන මෙම දහම් ග්‍රන්ථය දෙවන වරටත් මුද්‍රණය කරවා පිටපත් ප්‍රමාණයක් ලබාදීමේ පුණ්‍යකර්ම බලයෙන් එම මිය ගිය දියණියට සසර වසනාතුරු, නිවන් දක්නා ජාති දක්වා මෙවන් අකල් මරණයක් නොවේවායි''යි පතන අතර ඉක්මන් භවයකින්ම එම දියණියටත්, දෙමාපියන්ටත් සසර දුක් ගමන නිමා කිරීමේ භාග්‍ය උදාවේවාය'යි පතමි.

## 10. සුතසෝම ජාතකය

නිර්මාංශ ජීවිතයක් ගතරන මම ඉතා ආදර ගෞරවයෙන් යුතුව මෙම කථා වස්තුව පිටපත් කර එයට ක්‍රිස්තු වර්ෂ 2013 අවුරුද්දේ වැල්ලවායේ ප්‍රාදේශීය සභාපතිවූ රෝහණ වන්නිආරච්චි මහතාට කළගුණ සැළකීමක් වශයෙන් එතුමාගේ සත් ක්‍රියාදාමය වූ තමා සතු මුදල් ලක්‍ෂ දහයක් ගෙවා එම අවුරුද්දේ මස් ටෙන්ඩරය ගෙන 2013 අවුරුද්දේ මුළුල්ලෙහි වැල්ලවාය බල ප්‍රදේශයේ ගව ඝාතනය නැවැත්වීත් රටේ බොහෝ ප්‍රදේශවලට එය ආදර්ශයක් දීම වෙනුවෙන් රෝහණ වන්නිආරච්චි මහතා මට මුදලින් උපකාර කිරීමට සූදානම් වූවත් එතුමාගේ ඒවා කිසිවක් නොගෙන මට පූජා කරපු ගමන් ගාස්තු සහ පිරිකර පමණක් ගතිමි. එවන් ආදර්ශමත් උතුමන් තව තවත් මෙරටට බිහිවේවායි' යි ප්‍රාර්ථනා කරන අතර, එපින් එම අවුරුද්ද ඇතුලත දංගෙඩියට යන ගවයන් 3000 ට පමණ කිසිම භියක්, පීඩාවක්, මාරයාට කඹයවත් නොදුන් එතුමාගේ හතරවරිගෙක දෙමාපිය ගුරුවරු ඥාති හිතෛශීන්ටද මෙම කුසල් බලයෙන් නිවන් දක්නා ජාති දක්වා අකල් මරණයකට පත් නොවේවායි' යි පතමි.

## 11. ප්‍රශ්න තුන අංක I

මෙය ඉතා අහම්බයෙන් මෙන් කිසිම බලාපොරොත්තුවක් නොමැතිව මුද්‍රණය කර බෙදීමට ලැබුනු ඉතා අගනා දහම් ග්‍රන්ථයකි. මිලින්ද ප්‍රශ්නයේ එන ඥාති ප්‍රෙත සහ සිහින පෙනීමේ ප්‍රශ්නය සහ අකල් මරණ ප්‍රශ්ණය ඇතුලත් මෙලොව වශයෙන් දිට්ඨධම්ම වේදණීය වශයෙන් විපාක ලබාදෙන කාරණා ඇතුලත් දහම් ග්‍රන්ථය පූජණීය ලග්ගල කල්‍යාණවංස මාහිමාපාණන් වහන්සේගේ 40 වන උපන් දිනය සමරා ධර්ම දානය වශයෙන් මුද්‍රණය වියදම දැරූ බොරැල්ලේ "මොඩ් ටේලර්ස්" අධිපති රංජිත් මනම්පේරි සහ ඉන්ද්‍රාණි මනම්පේරි සහ දූ දරුවන් වන හිරන්‍යා ඉරාෂි මඩපාත, හසන්ත සමන් මඩපාත, කසුන් ඉෂාර මනම්පේරි යන පින්වතුන්ගේ අනුග්‍රහයෙන් ප්‍රසිද්ධ කරන ලදී. මෙම පින්වතුන්ට එම ධර්ම දානමය කුසල් බලය හිමිකර ගැනීමට අවස්ථාව උදාවූයේ ගල්දූව යෝගාශ්‍රමයේ වැඩ සිටින පූජ්‍ය මෙත්තානන්ද ස්වාමීන්වහන්සේගේ උපදෙස් සහ අනුශාසනා නිසා බව සිහිපත් කරමි.

## 12. කොසොල් රජතුමා දුටු සිහින 16

දැනට වයස අවුරුදු 76 කි මාගේ වයස අවුරුදු අටේදී අම්බලන්ගොඩ කෙලින් වීදියේ වෙළඳසැල ඉදිරිපට 1947 අවුරුද්දේ ඉදිකර තිබූ වෙසක් තොරණ මතක තබාගෙන ක්‍රිස්තු වර්ෂ 2007 දී ග්‍රන්ථාරූඩ කර කිහිප වතාවක් මුද්‍රණය සඳහා උත්සාහ කලත් එය බැරිව තිබියදී ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි මාසයේදී සමාජයට, රටට, පාලකයන්ට මඟ පෙන්වීමක් මෙයින් සිදුකර ඇත.

## 13. යශෝධරා කථා වස්තුව

මෙය මාගේ දෙවන දහම් ග්‍රන්ථයයි. ක්‍රිස්තු වර්ෂ 2015 අප්‍රේල් වන විට හයවන වතාවක් නැවත නැවත මුද්‍රණය කිරීමට වූයේ පාඨකයන්ගෙන් ලැබෙන ප්‍රසාදය නිසාය.

14. මහා මංගල සූත්‍ර දේශනාව

මෙකී නොකී දහම් ග්‍රන්ථ 15 ඇතුලුව තවත් පොත් 40 ක් පමණ මුද්‍රණය සඳහා සකස් කර තිබෙන්නේ දහම් ග්‍රන්ථයේ මූලික අනුග්‍රාහිකාව වූ රාජගිරියේ මැදවැලිකඩ පාරේ සණස බැංකුවේ කලමාණාකාරතුමියගේ මූලිකත්වයෙන් සහ එම බැංකුවේ ගරු සභාපති සුනිල් අබේසුන්දර මහතා සහ රාණි අක්කා ඇතුළු කාර්යාය මණ්ඩලයේ සියලු දෙනාගේම ඇප කැප වීම නිසා බව පුණ්‍යානුමෝදනාවෙන් සඳහන් කරමි.

15. සත් බුදුරජාණන් වහන්සේලා

ක්‍රිස්තු වර්ෂ 2015 වෙසක් පෙහොය අරමුණු කර ගෙන සංස්කරණය කලෙමි. විපස්සී බුදු රජාණන්වහන්සේ ප්‍රධාන කොට සම්මා සම්බුදු රජාණන් වහන්සේ දක්වා මහාකල්ප 91 ට පහල වී වදාල එම බුදුරාජාණන් වහන්සේලා පිළිබඳ අගනා විස්තරයක් සහ තවත් දැනගත යුතු දහම් දැනුමක් මෙමඟින් ඔබට ලැබේ.

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ඤාණරතන භවනා මධ්‍යස්ථානය,
පෙළෙන්ගස්හේන,
දොම්පේ.
02.06.2015



වලිගය කැඩී ගිය මී ගවයෙක් තමා මරණයෙන්
බේරාගත්තවුනට කෘතවේදී වෙමින්
(1999.01.31 - බුදු සරණ)



මරණාසන්නව වැතිර සිටින එළදෙනක් දෙස
නෙත් යොමා සිටින මරණයට කැප වූ තවත් ගවයෙක්
(1999.01.31 - බුදු සරණ)

මුද්‍රණය - ගගන ප්‍රින්ටර්ස් - 0719 850 841